විදුලි පණිවුඩ : " විශ්‍රාම වැටුප් " කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මගේ අංකය / எனது இல. / My No.: විවැ චක්‍රලේඛ / 2006

ඔබේ අංකය / உமது இல. / Your No.:

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය / திகதி / Date: 2006 - 11- 23

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 16 / 2006.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## <u>රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකවීමට ඉල්ලුම් කිරීමේදී පුද්ගලික හැඳුනුම්පත් අංකය සඳහන් කර එවීම</u>

රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායකවීම සඳහා එවනු ලබන ඉල්ලුම්පත්‍ර බොහෝමයක ඉල්ලුම් කරන නිලධාරියාගේ පුද්ගලික හැඳුනුම්පත් අංකය සඳහන් කර නොඑවීම නිසා ඔහුගේ දායක මුදල් පිළිබඳව පරිගණකයෙන් තොරතුරු ලබා ගැනීමේදී විවිධ දුෂ්කරතා පැන නැගී ඇත.

විශේෂයෙන්ම හමුදාව, පොලිසිය වැනි ආයතනවල සේවය කරන නිලධාරීන් ඔවුන්ගේ අර්ථ සාධක අරමුදල්වලට බැරවී ඇති දායක මුදල්වල ශේෂයන් පිළිබඳව නිතර විමසන අතර, ඔවුන්ගේ නම් උපයෝගී කරගෙන පරිගණකයේ එම තොරතුරු ලබාගැනීමේදී වැඩි කාලයක් හා ශ්‍රමයක් යෙදවීමට සිදු වේ. සමහරවිට එකම නම ඇති නිලධාරීන් කිහිපදෙනෙක් වූ විට මෙම තොරතුරු ලබාගැනීම වඩාත් සංකීර්ණ වේ. එමනිසා මෙම ගැටලු සහගත තත්ත්වය මගහරවා ගැනීම සඳහා රාජ්‍ය සේවා අර්ථ සාධක අංකය ලබා ගැනීමට ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී මින් ඉදිරියට පුද්ගලික හැඳුනුම්පත් අංකය සඳහන් කිරීම අනිවාර්ය කෙරේ. මේ සම්බන්ධයෙන් ඔබගේ ආයතනයේ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

තවද දැනට රාජ්‍යසේවා අර්ථ සාධක අංකය නිකුත් කර ඇති එහෙත් පුද්ගලික හැඳුනුම්පත් අංකය ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර නොමැති නිලධාරීන්ගේ පුද්ගලික හැඳුනුම්පත් අංකය යාවත් කාලීන කිරීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

**කේ. ඒ. තිලකරත්න**
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ
සභාපති හා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.